# දයා රාජපක්ෂ සමුගනියි



කාටූන් සහ සිංහල චිත්‍ර කතා කලාවේ පුරෝගාමියෙකු වූ දයා රාජපක්ෂ අභාවප්‍රාප්ත විය.
සිය ජීවිතයේ අවසාන කාලපරිච්ඡේදය දක්වාම රසිකයන් පිනවමින් සිටි දයා රාජපක්ෂ චිත්‍ර කතා ශිල්පියා මියයන විට 78 වන වියේ පසු විය.

හැටේ දශකයේ දී නෝටින්බ්‍රිජ්හි දයා රාජපක්ෂ නමින් චිත්‍රකතා ලෝකයට පිවිසි දයාගේ පළමු ජනප්‍රිය චිත්‍රකතාව වූ අනුපමා සිනමාවටද නැගුණි. ලේක්හවුස් ආයතනයේ සේවය කළ ඔහු එහි ප්‍රථම චිත්‍ර කතා පත්‍රය වන සතුට් ඔස්සේ මහත් ජනාදරයට පත් විය.

මෙරට පලවු පළමු වර්ණ චිත්‍ර කතාව වන පරිත්‍යාගය ද ඔහුගේ නිර්මාණයකි.

චිත්‍ර කතා ඇසුරින් බිහි වූ චිත්‍රපට සහ ටෙලි නාට්‍ය වැඩිම ප්‍රමාණයක් නිර්මාණය වී ඇත්තේ දයා රාජපක්ෂගේ චිත්‍ර කතා ඇසුරෙනි. ඔහුගේ සක්විති සුවය, හුළවාලි, තවලම ආදී චිත්‍ර කථා රැසක් සිනමා නිර්මාණ බවට පත් විය.




සම කාලීන ප්‍රවීණ චිත්‍ර කතා ශිල්පියෙකු වන ජනක රත්නායක දයාගේ අභාවය පිළිබඳව කියා සිටියේ දයා තරම් නිරහංකාර කලාකරුවකුගේ වියෝව අතිශය කණගාටුදායක පුවතක් බවයි.

ඔහුගේ චිත්‍ර පමණක් නොවෙයි රූප රාමු සහ දෙබස් ඉතාම ලස්සනයි. වෙනස්ම මගක් ගත් ශෛලියක් ඔහු සතුව තිබුනා. ඔහු නිසා චිත්‍ර කතා කලාව ජනතාව අතරට ගියා. අනෙකුත් ශිල්පීන් වෙනුවෙන් ඔහු විශාල කාර්ය භාරයක් ඉටු කළා. ජනක පවසයි

දයා රාජපක්ෂයන්ගේ දුලාරි, හතේ වසම, බොරළු පාර, අනුපමා ආදී චිත්‍ර කථා රැසක් පසු කාලීනව ටෙලි නාට්‍යවලට නැගුණි.







## S. S. RAJAMOULI ගේ BAHUBALI සහ සල්මන්ගේ BAJRANGI BHAIJAN ආදායම් වාර්තා තබයි




සල්මන් ඛාන් සහ කරීනා කපූර් රඟන Bajrangi Bhaijan සියලූ ආදායම් වාර්තා බිඳ හෙලමින් අති සාර්ථකව මේ දිනවල ඉන්දියාවේ තිරගත වෙමින් box office වාර්තා තබන්නට සමත් වී තිබෙන්නේ ,ඇතැම් චිත්‍රපට මෙතෙක් තබා ඇති වාර්තා ද බිඳ හෙළමිනි. Bajrangi Bhaijan සල්මන් ඛාන් ගේ නිෂ්පාදනයකි .

මේ අතර එස් එස් රාජ්මවුලි අධ්‍යක්ෂණය කළ Bahubali චිත්‍රපටය සල්මන්ගේ Bajrangi Bhaijan පරදවා ඩොලර් මිලියන 70.1 ක් උපයාගන්නට සමත්ව තිබෙනවා. මේ මුදල මෙතෙක් වැඩිම ආදායමක් ලද ෂාරුක් ඛාන්ගේ චෙන්නායි එක්ස්ප්‍රස් චිත්‍රපටයේ ආදායම් වාර්තාවද අභිබවා යන්නක්



## රූහිට රූහානිකා කැමැති නැහැයිලූ



Ye hai mohabaatein ජනප්‍රිය ටෙලි නාට්‍යයේ රූහිගේ චරිතය රඟපාන රූහානිකා ධවන් ළමා නිළිය මේ දිනවල අතිශය ජනප්‍රිය චරිතයක් තවමත් හත් හැවිරිදි රූහානිකා රඟපෑමට මෙන්ම ඉගෙනීමටත් මහත් ලෙස ආදරය කරන නිසා රූ ගත කිරීම් වලට යන්නේ පාසල් කාලයෙන් පස්සෙලූ.

රූහිගේ චරිතයට වඩා තමන් බොහෝ සෙයින් වෙනස් කෙනෙක් වගේම රූහි කියන නමට තමන් අකමැති බවත් ඇය පවසනවා. තමන්ගේ රූහානිකා කියන නමට බොහෝ සෙයින් කැමති මේ පුංචි නිළිය සුරතල් සතුන්ට ආදරය කරනවා.

“මම බල්ලන්ට ආසම නැහැ ,ඒත් බලූ පැටියන්ට ආසයි ,මගේ ගෙදරත් බලූ පැටියෙක් ඉන්නවා”

රූහානිකාගේ අනාගත බලාපොරොත්තුව නිළියක් වගේම විද්‍යා අංශයෙන් ඉහලට යන්නලූ

## කීර්ති පැස්කුවල්ගේ ප්‍රසංගය දා

